# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,922/6 — 1970 සැප්තැම්බර් 11 වැනි සිකුරාද — 1970.9.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සැම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)

## ආණ්ඩුවේ නිවේදන

අ.ආ.කා. අංක. ඕ. 487/61

ඉරානය වෙනුවෙන් සුවිශේෂ හා පූර්ණ බලැති තානාපති වශයෙන් ලංකාවේ පෙනී සිටීමට පත් කරනු ලැබූ ආචාර්ය මොහමඩ් හුසේන් මශයේක් fපරි දනි උතුමාණන්ගේ අක්ත පත්‍රය මහා රාජිණින් වහන්සේ වෙනුවෙන් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ භාර ගත්හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඩී. ජී. දයාරත්න,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1970 සැප්තැම්බර් 10 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කායර්‍යාලයේදීය.

9–698

---

### ලංකාවේ ව්‍යවස්ථාපිත අණපණත් මාලාවේ (171 වැනි පරිච්ඡේදයේ) ආහාර පාලන පනත

අංක 296 දරණ නියෝගය

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් මාලාවේ 171 වැනි පරිච්ඡේදයේ ආහාර පාලන පනතේ 4(1) (1) වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව විදේශිය සහ දේශිය වෙළඳ කටයුතු පිළිබඳ වැඩබලන ඇමති තැන්පත් පහල රාලලාගේ රත්නායක වන මම, යාපනේ අර්ධද්වීපයට රතු ලූනු කිසියම් ප්‍රමාණයක් රැගෙන යාම හෝ රථවාහනවලින් ගෙනයාම මෙයින් තහනම් කරමි.

මෙම නියෝගය සඳහා " යාපනේ අර්ධද්වීපය " නමින් හැඟවෙන්නේ, කරච්චි තුනුක්කයි ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය හැර යාපනේ පාලන දිස්ත්‍රික්කයයි.

පී. ආර්. රත්නායක,
වැඩ බලන විදේශිය සහ දේශිය වෙළඳ ඇමති.

1970 සැප්තැම්බර් 7 දින,
කොළඹ දීය.

9–577/1

---

### ලංකාවේ ව්‍යවස්ථාපිත අණපණත් මාලාවේ (171 වැනි පරිච්ඡේදයේ) ආහාර පාලන පනත

අංක 297 දරණ නියෝගය

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් මාලාවේ 171 වැනි පරිච්ඡේදයේ ආහාර පාලන පනතේ 4(1) (1) වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව විදේශ සහ දේශිය වෙළඳ කටයුතු පිළිබඳ වැඩ බලන ඇමති තැන්පත් පහල රාලලාගේ රත්නායක වන මම, මෙම නියෝගයෙන්—

(1) යාපනේ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර පාලක තැනගේ බලපත්‍රයක් නැතිව, එක් අයෙකු විසින් රාත්තල් 7 කට වැඩි රතු ලූනු ප්‍රමාණයක්—

(අ) යාපනේ අර්ධද්වීපය වටා ඇති මුහුදෙහි හෝ කලපුවේ වෙරළෙහි කිසියම් ස්ථානයක සිට ඔරුවකින් හෝ රුවල් නැවකින්,

(ආ) යාපනේ අර්ධද්වීපයෙන්,

(ඇ) පච්චිල්ලයිපල්ලෙයි ආදයම් පාලක නිලධාරියාගේ කොට්ඨාශයේ,

(ඈ) තෙන්මාංචචි ආදයම් පාලක නිලධාරියාගේ කොට්ඨාශයේ, මරවන්පුලව් හා තනන්කිලප්පු යන ගම් මුලාදනි කොට්ඨාශවල ප්‍රවාහනය කිරීම හෝ ගෙන යාම තහනම් කරමි.

මෙම නියෝගය සඳහා " යාපනේ අර්ධද්වීපය " නමින් හැඟවෙන්නේ කරච්චිතුනුක්කයි ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය හැර යාපනේ පාලන දිස්ත්‍රික්කයයි.

පී. ආර්. රත්නායක,
වැඩ බලන විදේශිය සහ දේශිය වෙළඳ ඇමති.

1970 සැප්තැම්බර් 7 දින,
කොළඹදීය.

9–577/2

668/13——ජේ 16761—14,490 (70/9)

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපණත් මාලාවේ (171 වැනි පරිච්ඡේදයේ) ආහාර පාලන පනත

### අංක 298 දරන නියෝගය

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් මාලාවේ 171 වැනි පරිච්ඡේදයේ ආහාර පාලන පනතේ 4 (1) (1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව, විදේශීය හා දේශීය වෙළඳ කටයුතු පිළිබඳ වැඩ බලන ඇමති තැන්පත් පහල රාලලාගේ රත්නායක වන මම ලංකාවේ එක තැනක සිට ලංකාවේ තව තැනකට ආහාර පාලක තැන විසින් හෝ ප්‍රථමයෙන් සඳහන් කළ තැන ඇතුළත් ප්‍රදේශයේ නියෝජ්‍ය ආහාර පාලක තැන විසින් හෝ සහකාර ආහාර පාලක තැන විසින් හෝ මේ ඉහත අය වෙනුවෙන් නිකුත් කළ බලපත්‍රයක් පිට හෝ නොහොත් එකී බලපත්‍රයක අන්තර්ගත කොන්දේසි පිට හැර, පාට කළ වී ඇට සහිත වී ප්‍රමාණයක් ප්‍රවාහණය කිරීම හෝ ගෙනයාම තහනම් කරමි.

එහෙත් මෙම නියෝගයෙන් ඉහත දක්වෙන, තහනම්, පහත සඳහන් ක්‍රියාවන්ට බලපවත්වන්නේ නැත :—

(අ) ලංකා රජය වෙනුවෙන් කිසිවෙකු එවැනි වී කිසියම් ප්‍රමාණයක් ප්‍රවාහනය කිරීම හෝ ගෙනයාම, හෝ

(ආ) ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලැබූ කිසියම් වී ප්‍රමාණයක් එසේ ලබාගත් ලියා පදිංචි කරනු ලැබූ වී මෝල් හිමියකු විසින් හෝ එකී වී මෝල් හිමියා වෙනුවෙන් යම්කිසි කෙනෙක් එකී වී මෝල් හිමියාගේ ගබඩාවට හෝ ව්‍යාපාරික ස්ථානයට ප්‍රවාහනය කිරීම හෝ ගෙනයාම.

මෙම නියෝගයෙහි—

" පාටකල වී ඇට " යනුවෙන් දක්වෙන්නේ " මැලචයිට්ග්‍රීන් " යන කොළ පාටින් හෝ " කොචින් ස්කාලට් " යන රතු පාටින් හෝ වෙනත් පාට කරන ද්‍රව්‍යකින් කෘතිම ලෙස පාට කළ විට කොළ හෝ රත්පාටක් නැඟුණු වී ය.

" ලියා පදිංචි කරන ලද වී මෝල් හිමියෙක් " යනුවෙන් දක්වෙනුයේ ගාස්තුවක් පිට හෝ ඒ වෙනුවට දෙන දීමනා පිට වී කෙටීම සඳහා ගොවිජන සේවා කොමසාරිස් තැන යථා කාලයට ලියා පදිංචි කළ කෙනෙකි.

පී. ආර්. රත්නායක,
වැඩ බලන විදේශීය හා දේශීය වෙළඳ ඇමති.

1970 සැප්තැම්බර් 7 වැනි දින,
කොළඹ 2.

9–577/3

---

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපණත් මාලාවේ (171 වැනි පරිච්ඡේදයේ) ආහාර පාලන පනත

### අංක 299 දරන නියෝගය

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් මාලාවේ 171 වැනි පරිච්ඡේදයේ ආහාර පාලන පනතේ 4 (1) (iv) දරණ වගන්තියෙන් මට පැවරී තිබෙන බලතල අනුව, මෙහි පෙනෙන උපලේඛනයේ, 1 වෙනි තීරයේ සඳහන් වරායවල හෝ ස්ථාන වල රේගුවෙන් හාල්, වී, තිරිඟු, තිරිඟු පිටි හෝ කුරක්කන් එම උප ලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් පුද්ගලයාගෙන් හෝ (කාරණයට අදාල පරිදි) පුද්ගලයන්ගෙන් ලබාගත් බලපත්‍රයක් යටතේ හා එම පුද්ගලයා විසින් නියම කරනු ලබන ගෙන යායුතු කාලය, ආකාරය හා ස්ථානය පිළිබඳව නියෝගය යටතේ මිස ගෙන යෑම විදේශීය සහ දේශීය වෙළඳ කටයුතු පිළිබඳ වැඩ බලන ඇමති තැන්පත් පහල රාලලාගේ රත්නායක වන මම, මෙම නියෝගයෙන් තහනම් කරමි.

පී. ආර්. රත්නායක,
වැඩ බලන විදේශීය සහ දේශීය වෙළඳ ඇමති.

1970 සැප්තැම්බර් 7 වෙනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

| 1 වෙනි තීරය<br>වරාය හෝ ස්ථානය | 2 වෙනි තීරය<br>බලපත්‍ර නිකුත් කළ හැකි අය |
|---|---|
| කොළඹ ... ... ... ... | ආහාර පාලක තැන |
| ගාල්ල ... ... ... ... | ආණ්ඩුවේ ඒජන්ත, ගාල්ල, නියෝජ්‍ය ආහාර පාලක තැන, ගාලු දිස්ත්‍රික්කය. |
| යාපනය, කන්කසන්තුරෙයි, කයිට්ස්, පේදුරුතුඩුව, වල්වෙඩ්ඩිතුරෙයි | ආණ්ඩුවේ ඒජන්ත, යාපනය, නියෝජ්‍ය ආහාර පාලක තැන, යාපනේ දිස්ත්‍රික්කය. |
| ත්‍රිකුණාමලය ... ... ... ... | ආණ්ඩුවේ ඒජන්ත, ත්‍රිකුණාමලය, නියෝජ්‍ය ආහාර පාලකතැන, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය. |
| තලෙයිමන්නාරම, මන්නාරම ... ... ... | ආණ්ඩුවේ ඒජන්ත, මන්නාරම, නියෝජ්‍ය ආහාර පාලකතැන, මන්නාරම් දිස්ත්‍රික්කය. |
| මඩකලපුව ... ... ... ... | ආණ්ඩුවේ ඒජන්ත, මඩකලපුව, නියෝජ්‍ය ආහාර පාලකතැන, මඩකලපුව දිස්ත්‍රික්කය. |
| බේරුවල, කළුතර ... ... ... | ආණ්ඩුවේ ඒජන්ත, කළුතර, නියෝජ්‍ය ආහාර පාලකතැන, කළුතර දිස්ත්‍රික්කය. |
| මුලතිව් ... ... ... ... | ආණ්ඩුවේ ඒජන්ත, වවුනියාව, නියෝජ්‍ය ආහාර පාලකතැන, වවුනියා දිස්ත්‍රික්කය. |
| පුත්තලම, කල්පිටිය ... ... ... | ආණ්ඩුවේ ඒජන්ත, පුත්තලම, නියෝජ්‍ය ආහාර පාලකතැන, පුත්තලම දිස්ත්‍රික්කය. |
| මීගමුව ... ... ... ... | ආණ්ඩුවේ ඒජන්ත, කොළඹ, නියෝජ්‍ය ආහාර පාලකතැන, කොළඹ දිස්ත්‍රික්කය. |

9–577/4

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.